වලපනේ ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 27 දින ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට වලපනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). කර්මාන්ත ණයගැති උපලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මූලධන ආධාර රු.41,294,029ක් වුවත් එය රු.41,841,733ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ණයගැතියන් රු.547,703ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ). කර්මාන්ත ණයහිමි ලේඛනය අනුව ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ගෙවිය යුතු මුදල රු.1,000,000ක් වුවත් එය රු.1,700,000ක් ලෙස ගිණුම්ගතකිරීම නිසා ණයහිමියන් රු.700,000ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ). ඉතිරි තොගවල වටිනාකම, වූ රු. 1,359,187ක් ස්ථාවර වත්කම්වලට එකතුකර ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.

(ඈ). ඉදිරියට ගෙවන ලද අක්කර බදු රු.2,446ක් අක්කර බදු ණයගැතියන්ගෙන් අඩුකර දක්වා තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.12,873,979ක් වූ ගිණුම් විෂයයන් 05කට අදාළ ශේෂයන් සහ ඊට අදාළ උපයෝගී ලේඛණවල දැක්වෙන රු.12,983,565ක ශේෂයන් අතර රු.109,586ක නොසැසඳීමක් විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම

2015 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය රු.5,497ක් වූ අතර එම ශේෂයට පාදක වූ හේතු පරීක්ෂාකර බලා නිරවුල් කිරීමට 2016 අප්‍රේල් 08 වන විටත් කටයුතු කර නොතිබුණි.

1.3.4 ලැබිය යුතු ගිණුම්

2015 දෙසැම්බර් 31 දිනට අයකර ගතහැකි උපයෝගී සේවා ගිණුම් ශේෂයේ වටිනාකම රු.64,320,555ක් වූ අතර එයින් රු.22,814,068ක් වසර එකක කාලයක් ඉක්මවා තිබුණි.

1.3.5 ගෙවිය යුතු ගිණුම්

---------------------

2015 දෙසැම්බර් 31 දිනට ණයහිමි පාලන ගිණුමේ ශේෂය රු.58,598,222ක් වූ අතර එයින් වසර 01ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.30,206,345ක් වී තිබුණි.

1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම.

----------------------------------

(i) අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.21,040,024ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ii) 2015 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණ බැවින් සභාවේ කාර්යාල උපකරණ, ලී බඩු සවිකිරීම් සහ ගබඩා තොගවල පැවැත්ම හා වටිනාකම් පිළිබඳ නිවැරදිභාවය විගණනයේදී පරීක්ෂා කළ නොහැකි විය.

1.3.7 නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.

-------------------------------------------------

පහත දැක්වෙන නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| ප්‍රාදේශීය සභා (මුල්‍ය පරිපාලනය) රීති අංක 218 | ාවේ ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව වාර්ෂිකව ක්ෂාකිරීමට කටයුතු කර නොතිබුණි. |
| රජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ වගන්තිය | ාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරුවීම් ලබාගිය/ ්වය අත්හිටුවා ඇති/ මියගොස් ඇති නිලධාරීන් 10 නෙකුගේ රු.140,299ක ණය ශේෂ අයකරගෙන ාතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල.

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,781,425ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,168,770ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී අතිරික්තයේ රු.1,612,655ක වර්ධනයක් දක්නට ලැබුණි. එම වර්ධනය සඳහා ආදායම් විෂයයන් 05ක වැඩිවීම සහ වියදම් විෂයයන් 07ක අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

2.2 ආදායම් පරිපාලනය

----------------------

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

-------------------------------------

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015.01.01 දිනට හිඟය | 2015.12.31 දින හිඟයෙන් අය කිරීම | 2015 වර්ෂයේ බිල්කිරීම් | වර්ෂයේ බිල්කිරීම් වලින් අයවීම | 2015.01.01 දිනට පැවති හිඟයෙන් | වර්ෂයේ බිල්කිරීම් වලින් | මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 1,986,556 | 759,668 | 2,097,80.2 | 1,420,964 | 1,226,888 | 676,838 | 1,903,726 |
| කඩ කුලී | 3,593,210 | 307,270 | 2,572,.965 | 1,999,515 | 3,285,940 | 573,450 | 3,859,890 |
| බලපත්‍ර ගාස්තු | - | - | 1,944,290 | 1,994,290 | - | - | - |
| වෙනත් | 250,063 | 52,368 | 276,100 | 210,250 | 197,695 | 65,850 | 263,545 |

2.2.2 වරිපනම් බදු

2015 දෙසැම්බර් 31 දිනට රු.1,903,726ක අයවිය යුතු වරිපනම් බදු මුදලක් පැවතියද, එම මුදල් අයකර ගැනීම සඳහා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 33 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.2.3 බදු කුලී

2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බදු කුලී රු.3,859,390ක් වූ අතර එම මුදල අයකර ගැනීම සඳහා අදාළ ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.2.4 මස් කඩ කුලී

වසර 05කට අධික කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.1,221,267ක මස්කඩ කුලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු

ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් පුවරු සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගැසට් මගින් ප්‍රකාශයට පත් කර තිබුණ ද විධිමත් පරිදි සමීක්ෂණයක් සිදුකර ගාස්තු අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

2015 දෙසැම්බර් 31 දිනට 5,284,340ක මුද්දර ගාස්තු සහ රු.1,588,012ක උසාවි දඩ අයවිය යුතුව තිබුණි.

2.2.7 අධිභාර

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවළුන්ට එරෙහිව ම විසින් ඉකුත් වර්ෂයන් තුළ පනවන ලද අධිභාර අනුව 2015 දෙසැම්බර් 31 දිනට රු.29,975ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යය සාධනය ඇගයීම

ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ලබාදී තිබූ රු.1,000,000කට අදාළ ව්‍යාපෘති නිමකර එම බිල්පත් 2015 දෙසැම්බර් 28 දිනට ප්‍රථම ප්‍රතිපූර්ණය කිරීම සඳහා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම මුදල් සභාවට ලැබීම අවිනිශ්චිත තත්ත්වයක පැවැතුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

සභාවේ ජල සැපයුම් ව්‍යාපෘතිය වෙනුවෙන් වර්ෂය තුළ රු.2,169,371ක් වැය කර තිබුණද, ආදායම් උපයාගෙන තිබුණේ රු.287,550ක් පමණි.

3.3 ව්‍යාපෘති ප්‍රමාදකිරීම්

---------------------

සභාව ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ රු.300,000ක වියදමින් 2015 දෙසැම්බර් 28 දිනට ප්‍රථම නිල්දණ්ඩාහින්න උපකාර්යාලය අවට කාණු පද්ධතිය අලුත්වැඩියාව සිදුකළ යුතු වුවත් එය 2016 අප්‍රේල් 07 දින වන විටත් නිමකර නොතිබුණි.

3.4 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

සභාව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබූ අතර, පරිසරයට හානිවන පරිදි රාගල ලින්ස්ඩේල් වත්ත යන ස්ථානයට කසළ බැහැර කරමින් පැවතුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

----------------------------------------

4.1 අයවැය පාලනය

------------------

(i) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසැඳීමේදී ආදායම් විෂයයන් 06 ක සියයට 13 සිට සියයට 55 දක්වාද වියදම් විෂයයන් 08 ක සියයට 09 සිට සියයට 186 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

(ii) ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 ප්‍රකාරව අයවැයගත මූල්‍ය ප්‍රතිපාදන, පරිපූරක සමඟ සසඳා බලා එක් එක් අය/වැය විෂයයන්ගේ අතිරික්තතා/ ඌණතා පිළිබඳ කරුණු පැහැදිලිකිරීමේ ප්‍රකාශයන් පිළියෙලකර ඉදිරිපත්කර නොතිබුණි.

4.2 වත්කම් කළමනාකරණය

------------------------------

නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

සභාව සතු රු.2,758,000ක් වටිනා වත්කම් විෂයයන් 08ක් වර්ෂයකට අධික කාලයක් නිශ්කාර්යයව පැවතුණි.

5. පද්ධති හා පාලන.

--------------------

පහත සඳහන් පද්ධති හා දුර්වලතා කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඇ) ණයගැති හා ණයහිමි පාලනය